සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

25A S I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

## Second Term Test - Grade 13 - 2019

විභාග අංකය .............................

## ඉන්දියා ඉතිහාසය I

කාලය පැය තුනයි

**උපදෙස්**

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

* අංක 01 සිට 10 තෙක් ඇති ප්‍රශ්න සඳහා නාම/ස්ථාන5 බැගින් දී ඇත. එයින් එකක්අනෙක් ඒවා සමග නොගළපේ. නොගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය වරහන තුළ ලියන්න.

01. 1. මහානදී 2. ගෝදාවරී 3. නර්මදා 4. කාවේරි 5. කෘෂ්ණා (.....)

02. 1. ඛයිබර් 2. මක්‍රාන් 3. බැරෝඩා 4. කාරකෝරම් 5. බෝලාන් (.....)

03. 1. චේනාබ් 2. ජේලම් 3. ගුමාල් 4. රාවි 5. බියස් (.....)

04. 1. මෞර්ය 2. සිසුනාග 3. නන්ද 4. හර්යංක 5. පුෂ්‍යමිත්‍ර (.....)

05. 1. ශූද්‍රක 2. කාලිදාස 3. බානභට්ට 4. භාස 5. විශාඛදත්ත (.....)

06. 1. තංජෝර් 2. මාමල්ලපුරම් 3. මදුරෙයි 4. කාංචිපුරම් 5. සෝම්නාත් (.....)

07. 1. නාලන්දා 2. වික්‍රමශිලා 3. ඕදන්තපුර 4. අමරාවතී 5. ජගද්දලා (.....)

08. 1. ජස්ටින් 2. ප්ලුටාර්ක් 3. බෂාම් 4. කර්ටියස් 5. මෙගස්තිනිස් (.....)

09. 1. පුරෝහිත 2. භාගදුග 3. සුත 4. නියාම 5. සංග්‍රාහිත්‍රී (.....)

10. 1. පුරුෂපුර 2. ශ්‍රාවස්ති 3. කෞෂම්බි 4. අංග 5. පාඨලීපුත්‍ර (.....)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් පද යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇතිවරහන තුළ ලියන්න.**

11. 1. පාණ්ඩ්‍ය - මදුරෙයි
    2. චෝළ - තන්ජෝර්
    3. පල්ලව - කාංචි
    4. සාතවාහන - කළ්‍යාණි
    5. චාලුක්‍ය - වෙංගි (.....)

12. 1. අශෝක - පියදසි
2. බිංදුසාර - අමිත්‍රඝාත
3. දෙවන චන්ද්‍රගුප්ත - වික්‍රමාදිත්‍ය
4. නරසිංහ වර්මන් - වාතාපිකොණ්ඩ
5. ගෞතමී පුත්‍ර ශාතකර්ණී - සකල උත්තරාපථනාථ (.....)

13. 1. බාණභට්ට - හර්ෂචරිතය
2. පතංජලී - මාහාභාෂ්‍ය
3. කල්හාණ - මාලවිකාග්නිමිත්‍ර
4. පාණිනී - අෂ්ටාධ්‍යායී
5. පළමුවන මහේන්ද්‍රවර්මන් - මත්තවිලාස ප්‍රහසන (.....)

14. 1. කුසිනාරා - මල්ලවරු
2. වෛශාලි - ලිච්ඡවීවරු
3. පිප්පලී වනයේ - මෝරියවරු
4. කපිලවස්තු - භග්ගවරු
5. මිථිලාවේ - විදේහවරු (.....)

15. 1. මහේන්ද්‍රගිර - විෂ්ඨපුරයේ
2. උග්‍රසේන - පල්ලක්කයේ
3. කුවේර - දේවරාෂ්ට්‍රයේ
4. විෂ්ණුසෝප - කාංචි පුරයේ
5. දමන - අවමුත්තයේ (.....)

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම/දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත්ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Y කීරුව, X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දැක්වෙන සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.**

16.

| | X | | Y |
|---|---|---|---|
| 1. | අප්සරා | A | යුද්ධයට අධිපති දෙවියා |
| 2. | වරුණ | B | මරණයට අධිපති. |
| 3. | ඉන්ද්‍ර | C | ගාන්ධර්වයන්ගේ භාර්යාවෝ |
| 4. | උෂස් | D | අහසට අධිපති දෙවියා |
| 5. | යම | E | අරුණෝදයට අධිපති දේවතාවිය |

1. ADCBE 2.BCADE 3.CDAEB 4. DEABC 5. EDABC (.....)

17.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ශාකුන්තලය | A | චරිතාපදානයකි. |
| 2. | හර්ෂ චරිතය | B | නාට්‍යයකි. |
| 3. | මහා භාරතය | C | ඉතිහාස කෘතියකි. |
| 4. | පංච තන්ත්‍රය | D | උපදේශ කාව්‍යයකි. |
| 5. | රාජතරංගණිය | E | වීර කාව්‍යයකි. |

1. ABCDE 2.BAEDC 3.CBADE 4. DEABC 5. EDBCA (.....)

18.

| | X | | Y |
|---|---|---|---|
| 1. | වාතාපිකොණ්ඩ | A | බින්දුසාර |
| 2. | කවිරාජ | B | හර්ෂවර්ධන |
| 3. | සකල උත්තරාපථනාථ | C | සමුද්‍රගුප්ත |
| 4. | මුම්මඩිචෝළ | D | නරසිංහ වර්මන් |
| 5. | අමිත්‍රඝාත | E | 1 වන රාජ රාජ |

1. ABCDE 2.BACED 3.CABED 4. DCBEA 5. EDCAB (.....)

| | X | | Y |
|---|---|---|---|
| 19. | 1. ධර්මපාල | A | II චන්ද්‍රගුප්ත |
| | 2. සමුද්‍රගුප්ත | B | හර්ෂවර්ධණ |
| | 3. රාජ්‍ය වර්ධන | C | බින්දුසාර |
| | 4. චන්ද්‍රගුප්ත මෞර්ය | D | ප්‍රසේනජිත් |
| | 5. අමිත්‍රඝාත | E | දේවපාල |

1. ABCDE 2.BCADE 3.CBADE 4. DEABC 5. EABCD (.....)

| | X | | Y |
|---|---|---|---|
| 20. | 1. තෝරමාන | A | තක්ෂිලාව පාලනය කළ මුල්ම ශක පාලනය. |
| | 2. ඇලෙක්සැන්ඩර් | B | වයඹදිග ඉන්දියාව අල්ලාගත් මැසිඩෝනියානු පාලකයා |
| | 3. මාවුස් | C | ඉන්දියාවේ පළමුවන පහ්ලව පාලකයා |
| | 4. කුජුල කැඩ්පයිසීස් | D | ඉන්දියාව ආක්‍රමණය කළ හූණ නායකයා. |
| | 5. ගොන්ඩොපර්නිස් | E | ඉන්දියාවේ පළමුවන යු-ඒ-චි පාලකයා |

1. ADCBE 2.BEDCA 3.CAEDB 4. DBAEC 5. ECBAD (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකට ගැළපෙන පිළිතුර තෝරා, ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. පශ්චාත් වෛදික යුගයේ වර්ණාශ්‍රම ධර්ම අනුව 'චූඩා කර්මන්' ලෙස හඳුන්වන ලද්දේ,
1. නම් තැබීම. 2. කෙස් කැපීම 3. ඉඳුල්කට ගෑම 4. විවාහය 5. අවමංගල්‍යය (.....)

22. මහානාන තටාකයේ නටබුන් දක්නට ලැබෙන්නේ කුමන ඉන්දු නිම්න නගරයේද?
1. රූපාර් 2. හරප්පා 3. මොහෙන්ජොදාරෝ 4. චන්හුදාරෝ 5. කලිබංගන් (.....)

23. 'ත්‍රිකෝණ අරගලය'ට සම්බන්ධ වූ රාජවංශ 3 නම් කරන්න.
1. මෛත්‍රික, ප්‍රතිහාර, පාල 2. රාෂ්ට්‍රකූට, ප්‍රතිහාර, මෛත්‍රීන
3. චාලුක්‍ය, පාල, ප්‍රතිහාර 4. පුෂ්‍යභූති, ප්‍රතිහාර, රාෂ්ට්‍රකූට
5. පාල, ප්‍රතිහාර, රාෂ්ට්‍රකූට (.....)

24. කුෂාණ වංශික කණිෂ්ක රජුගේ පාලන මධ්‍යස්ථානය වූයේ,
1. තක්ෂිලාව 2. පුරුෂපුරය 3. පාඨලීපුත්‍ර 4. ශ්‍රාවස්ත්‍රිය 5. අලහබාද් (.....)

25. රාෂ්ට්‍රකූට රාජවංශයේ ආරම්භක පාලකයා ලෙස සැලකෙන්නේ කවරෙක්ද?
1. මාවුස් 2. දන්තිදුර්ග 3. මහේන්ද්‍රවර්මන් 4. කණිෂ්ක 5. ධ්‍රැව (.....)

- **අංක 26 - 30 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

26. ඍග් වෛදික යුගය,
1. වෛදික වැසියා පිළිම වන්දනා නොකළහ.
2. සමාජය ගෝත්‍රික තත්වයක පැවතිණි.
3. ඍග් වෛදික වැසියන්ගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය විය.
4. මෙම අවධියේ ප්‍රධාන දෙවිවරුන්වූයේ අග්නි. ඉන්ද්‍ර සහ වරුණය.
5. මේ අවධියේදී ගංගානම් ගං නිම්නයේ ප්‍රබල රාජාණ්ඩු කිහිපයක් පෙරමුණට පැමිණියේය. (.....)

27. දෙවන චන්ද්‍රගුප්ත රජතුමා,
1. ගුප්ත අධිරාජ්‍යයේ ප්‍රධානියා ය.
2. ධ්‍රැවදේවි ඔහුගේ බිසව විය.
3. හින්දුකුෂ් කඳුවැටියෙන් ඔබ්බට ආක්‍රමණය මෙහෙයවීය.
4. ගුජරාටයේ හා කතියවෝරයේ පැවති ශක බලය බිඳ දමන ලදී.
5. විවාහ සම්බන්ධතා මගින් ද තම තත්වය තහවුරු කර ගත්තේය. (.....)

28. ක්‍රි.පූ. හයවන සියවසේ උතුරු ඉන්දියාවේ දේශපාලන තත්වය,
1. ගෝත්‍රිකත්වයේ සිට ස්ථාවර දේශසීමා ඇති රාජාණ්ඩු හෝ සමූහාණ්ඩු ලෙස නිර්මාණය විය.
2. ජනපද අතරින් බහුතරය රාජාණ්ඩු විය.
3. බිහි වූ ජනපද සංඛ්‍යාව 16ක් විය.
4. ප්‍රධාන රාජාණ්ඩු වූයේ, අවන්ති, මගධ, ගන්ධාර හා කෝසල යන රාජාණ්ඩුය.
5. මගධ රාජ්‍ය බලවත් කිරීම සඳහා මුල් පදනම දමනු ලැබුයේ බිම්බිසාර රජතුමාය. (.....)

29. හුණ ආක්‍රමණවල බලපෑම,
1. ඉන්දියානුවන්ගේ ධනය කොල්ලකෑහ.
2. ඔවුහු උතුරු ඉන්දියාවේ එක්සත්භාවය විනාශ කළහ.
3. කාශ්මීරයේ බෞද්ධ ආරාම හා සිද්ධස්ථාන විනාශ කර දැමූහ.
4. ඔවුහු පසුව උතුරු ඉන්දියාවේ ප්‍රධානම පාලකයෝ බවට පත්වූහ.
5. හුණයන් හින්දු සමාජයට සම්මිශ්‍රණයවීම හේතුකොටගෙන නව කුල බිහිවිය. (.....)

30. පල්ලව සභ්‍යත්වය,
1. පල්ලව සමයේ ඉදි වූ දේවාලවල රජවරුන්ගේ ජීවන අවස්ථා කැටයම් කර ඇත.
2. පල්ලව රාජ්‍ය සමයේදී මත්ත විලාස ප්‍රහසන ග්‍රන්ථය රචනා කෙරිණි.
3. දේවාල ඉදිකිරීමේ නව සම්ප්‍රදායක් වූ රථ නම් වූ අංගය ඔවුන් විසින් හඳුන්වා දෙන ලදී.
4. මදුරෙයි මහා දේවාලය ඔවුන් විසින් ඉදිකරන ලද වැදගත් නිර්මාණයක් විය.
5. මෙම රාජ්‍ය අවධියේදී පල්ලවයන්ගේ අගනුවර වූ කාංචිය ඉන්දියාවේ වැදගත් සංස්කෘතික මධ්‍යස්ථානයක් විය. (.....)

- **අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට දක්වා ඇති ප්‍රතිචාර අතරින් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය.**

නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,
A සහ B පමණක් නිවැරදිනම් 1 ද,
B සහ C පමණක් නිවැරදි නම් 2 ද,
C සහ D පමණක් නිවැරදි නම් 3 ද,
A සහ C පමණක් නිවැරදිනම් 4 ද,
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිනම් 5 ද වරහන තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | A හා C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැදිය. |

31. පශ්චාත් වෛදික යුගයේ දේශපාලනය,
(A) රාජ්‍යත්වය පාරම්පරිකව උරුමවීමේ සම්ප්‍රදායක් ඇතිවීම.
(B) අශ්වමේධ, රාජසූය වැනි මහා යාග හෝම චාරිත්‍ර පාලකයාගේ බලය ඉස්මතු කරවනු ලැබීම.
(C) සරල පාලන රටාව සංකීර්ණ තත්වයට පත්විය.
(D) සමිති හා සභා යන පාලන සංවිධාන රාජ්‍ය පාලන ආයතන විය. (.....)

32. සොළොස් මහා ජනපද පිහිටුවීමට බලපෑ ඓතිහාසික පසුබිම
(A) පශ්චාත් වෛදික යුගයේ අවසානය වන විට ආර්යයන් ගංගානම් ගං නිම්නයේ විශාල ප්‍රදේශයක ව්‍යාප්ත විය.
(B) පුළුල් දේශපාලන ඒකක ගොඩ නැඟීමට උතුරු ඉන්දියාවේ භූගෝලීය පසුබිම ඉවහල් විය.
(C) ආර්යයන් මුලින්ම ගංගා නිම්නය ආශ්‍රයකොට ගෙන පදිංචි වීම.
(D) ක්‍රි.පූ. 7 වන සියවසේ උතුරු ඉන්දියාවේ ස්ථාවර දේශපාලන ඒකක 16ක් බිහිවීම. (....)

33. මගධ අධිරාජ්‍යයේ ප්‍රභවය හා ව්‍යාප්තිය,
(A) දේශපාලන බලය ලබා ගැනීම පෙළපත අවශ්‍ය වීම.
(B) හර්යංක පරපුරේ බිම්බිසාර, අජාසත්ත වැනි කාර්යශූර පාලකයන් බිහිවීම.
(C) 'මත්ස්‍ය පානය' විවාහ සබඳතා, මිත්‍ර සබඳතා, ආගමික සබඳතා වැනි විවිධ උපක්‍රම මගින් රාජ්‍ය පුළුල් කිරීම.
(D) අජාසත් රජු මගධයේ සේනාබලය පළමුව සංවිධානය කිරීම. (.....)

34. ශකවරු,

(A) ශකවරු ඉන්දියාවට ඇතුළුවූයේ බයිබර් දූර්ගය හරහායි.

(B) ඔවුහු බෙංගාලය දක්වා තම ආධිපත්‍යය වර්ධනය කිරීමට සමත් වූහ.

(C) ශකවරුන්ගේ ප්‍රාන්තභාර ආණ්ඩුකාරවරුන් හඳුන්වන ලද්දේ ක්ෂත්‍රප නමිනි.

(D) ඉන්දියාවට පැමිණි ශකවරුන්ගේ කණ්ඩායම් හතරකි. තක්ෂිලා. මථුරා, උජ්ජේනි හා මහා රාෂ්ට්‍ර කේන්ද්‍රකොටගෙන පදිංචි වූහ. (.....)

35. රුද්‍රදාමන්ගේ ජුනාගාර් සෙල්ලිපිය,

(A) මෙම සෙල්ලිපියටඅනුව අශෝක යටතේ සෞරාෂ්ට්‍රයේ ප්‍රාදේශීය ආණ්ඩුකාරයා වූයේ යවනරාජ තුසාප නැමැත්තෙකි.

(B) මෙම සෙල්ලිපිය නිකුත් කරවූ රුද්‍රදාමන් වනාහි මෞර්ය යටත් පාලකයෙකි.

(C) ගිර්නාර්හි සුදර්ශන ජලාශය ඉදිකරවන ලද්දේ චන්ද්‍රගුප්ත මෞර්ය රජු යටතේ එම තනතුරම හෙබවූ වෛශ්‍ය පුෂ්පගුප්ත විසින් බව මෙම සෙල්ලිපියේ සඳහන් වේ.

(D) සෞරාෂ්ට්‍රය පිහිටියේ ඩෙකෑනයේය. (.....)

- **අංක 36 සිට 40 දක්වා තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 හා 5 වන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 1. නිවැරදිය | නිවැරදිය |
| 2. නිවැරදිය | නිවැරදි |
| 3. වැරදිය | වැරදිය |
| 4. වැරදිය | නිවැරදිය |
| 5. නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 36. ඉන්දියාවට සංක්‍රමණය වූ ශකයන් විදේශකයන් හා ම්ලේච්ඡයින් ලෙස සලකනු ලැබේ. | ඔවුහු හින්දුකුෂ් තරණය කොට බෝලාන් දූර්ගය හරහා ඉන්දු නිම්නයට ඇතුල් වී ඉන්දියාවට පැමිණියහ. (.....) |
| 37. රාජතරංගණිය කාශ්මීර ඉතිහාසය විස්තර කරයි. | රාජතරංගණියේ කර්තෘවරයා බානය. (.....) |
| 38. පාඨලීපුත්‍ර නගරයේ පාලනය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මෙගස්තීනිස්ගේ ග්‍රන්ථයෙන් ලැබේ. | නගරය පාලනය වූයේ පස්දෙනෙකුගෙන් යුත් කමිටු හයක සාමාජිකයන් 30 කින් සමන්විත මණ්ඩලයක් මගිනි. (.....) |
| 39. අශ්වඝෝෂ වාසය කළේ ක්‍රි.ව. 4 වන සියවසේදීය. | ඔහු විසින් මහාභාෂ්‍යය හා ස්වප්න වාසවදත්තා රචනා කරන ලදි. (.....) |
| 40. රාජ්‍ය කැබලිවීම හා චෝළ ආක්‍රමණ ගුප්ත පාලනය අවසන් වීමට හේතුවිය. | ගුප්ත යුගයේ අවසන් පාලකයා ලෙස සැලකෙන්නේ බුධ ගුප්ත නැමැත්තාය (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

25A S II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 13 - 2019**

විභාග අංකය .............................

## ඉන්දියා ඉතිහාසය II

උපදෙස්

♦ පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

## I කොටස

**පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත.**

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

1. ඛයිබර් දුර්ගය 2. භාරුකච්ච 3. පුරුෂපුරය 4. හින්දුකුෂ් කඳු
5. මථුරා 6. මහානදිය 7. මොහෙන්ජොදාරෝ 8. පාඨලී පුත්‍රය
9. ජුනාගාද් 10. කෞෂම්බි 11. ගෝව 12. අජන්තා

(නිවැරදිව නම් කිරීමට හා ලකුණු කිරීමට ලකුණු 1 බැගිනි) (ල. 12)

02. ඍග් වෛදික යුගයේ ආගමික විශ්වාස හා චාරිත්‍ර පශ්චාත් වෛදික යුගයේදී කෙසේ වෙනස් විදැයි විස්තර කරන්න. (ල. 16)

03. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පහත දැක්වෙන ශීර්ෂ යටතේ සාකච්ඡා කරන්න.

1. නාගරික සැලසුම් 2. පරිහානිය හා බිඳ වැටීම. (ල. 16)

04. මෞර්ය අධිරාජ්‍ය පිරිහීමට අශෝක රජුගේ ප්‍රතිපත්ති ඉවහල් විය.

(i) මෞර්ය රාජ වංශයේ අවසන් පාලකයා කවුරුන්ද? (ල. 1)

(ii) මෞර්යයන්ගෙන් රාජ්‍ය බලය පැහැරගත් පාලකයාගේ නම හා ඔහුගේ රාජවංශය නම් කරන්න. (ල. 2)

(iii) රටවැසියන්ගේ සදාචාර වර්ධනයට අශෝක රජු අනුගමනය කළ ප්‍රතිපත්තිය කෙටියෙන් දක්වන්න. (ල. 6)

(iv) ඉහත ප්‍රකාශය සමග ඔබඑකඟ වන්නේද? හේතු දක්වන්න. (ල. 7)

05. ක්‍රි.පූ. 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ දේශපාලන තත්වය විස්තර කරන්න. (ල. 16)

## II කොටස

06. පහත දැක්වෙන අංශ යටතේ කණිෂ්ක රජුගේ කාර්ය සාඵල්‍යය සාකච්ඡා කරන්න.
(i) සංස්කෘතික අභිවර්ධනය
(ii) උතුරු ඉන්දියාව එක්සත් කිරීම හා යුධ ජයග්‍රහණ. (ල. 16)

07. 'හර්ෂවර්ධන රජු යුද්ධය හා සාමය යන දෙඅංශයේදීම ශ්‍රේෂ්ඨයෙක් විය.'
(i) හර්ෂවර්ධන රජු අයත්වූ රාජවංශය නම් කරන්න. (ල. 1)
(ii) හර්ෂ වර්ධන රජුගේ පාලනය පිළිබඳ තොරතුරු සපයන මූලාශ්‍ර 3ක් නම් කරන්න. (ල. 3)
(iii) ඔහු කනෞජයේ සිහසුනට පත්වීම පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල. 4)
(iv) ඔහුගේ යුධ ව්‍යාපාර හා ආගමික හා සංස්කෘතික කටයුතු කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත සඳහන් ප්‍රකාශය පරීක්ෂා කරන්න. (ල. 8) (මුළු ලකුණු 16)

08. එක්කෝ (A) කොටසට නැතහොත් (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න.
(A) සාතවාහනයන් යටතේ ඩෙකෑනයේ සමාජ හා ආගමිකතත්වය සාකච්ඡා කරන්න.
(B) මහායාන බුද්ධාගමේ ප්‍රගතිය උදෙසා කුෂාණයින්ගේ දායකත්වය විස්තර කරන්න. (ල. 16)


09. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම 2ක් පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.
1. ගුප්තයන් යටතේ සිදුවූ සාහිත්‍ය වර්ධනය
2. ක්‍රි.පූ. 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ රාජධානි
3. හූණ ආක්‍රමණ
4. චන්ද්‍රගුප්ත මෞර්ය (එක් කොටසකට ලකුණු 8 බැගින් ලකුණු 16)

දෙවන වාර පරීක්ෂණය - 2019 - ඉන්දියා ඉතිහාසය.
පිළිතුරු 13 - ශ්‍රේණිය 1 කොටස

| | | | |
|---|---|---|---|
| **01.** - 3 | **11.** - 4 | **21.** - 2 | **31.** - 5 |
| **02.** - 4 | **12.** - 5 | **22.** - 3 | **32.** - 2 |
| **03.** - 3 | **13.** - 3 | **23.** - 5 | **33.** - 2 |
| **04.** - 4 | **14.** - 4 | **24.** - 2 | **34.** - 3 |
| **05.** - 3 | **15.** - 5 | **25.** - 2 | **35.** - 4 |
| **06.** - 5 | **16.** - 3 | **26.** - 5 | **36.** - 5 |
| **07.** - 4 | **17.** - 2 | **27.** - 5 | **37.** - 1 |
| **08.** - 3 | **18.** - 4 | **28.** - 4 | **38.** - 2 |
| **09.** - 4 | **19.** - 5 | **29.** - 4 | **39.** - 3 |
| **10.** - 4 | **20.** - 2 | **30.** - 4 | **40.** - 4 |

(ලකුණු 40)

<u>11 පත්‍රය - පිළිතුරු</u>




02. පූර්ව වෛදික යුගයේ ආගමික හා චරිත්‍ර :

* පීතෘ ආධිපත්‍ය පිළිබිඹු කරයි. * සංචාරක එඬේර ජීවිතයක් ගතකළ යුගයකි.
* ස්වභාවධර්මයේ විවිධ වස්තූන්ට හා බලවේගවලට දේවත්වය ආරෝපනය කොට ගෙන ඇත.
* බහුදේව සංකල්පය ඇතිවිය. * මෙම යුගයේදී ප්‍රධානත්වයට පත් දෙවිවරු කිහිප දෙනෙකි.
* නිවාසවල ගිනි දෙවියන් වන්දනය කරන ලදී.

පශ්චාත් වෛදික යුගය වන විට :

* බලවත් දෙවිවරු ක්‍රමයෙන් අඩු වී ත්‍රී මූර්තිය ඇදහීමට පටන්ගැණින. * බ්‍රහ්ම, විෂ්ණු, යම හෙවත් මහේෂ්වර දෙවිවරු වන්දනා කිරීම. * බහුදේව වන්දනය වෙනුවට ඒකදේව වන්දනය ඇදහීම * මහා බ්‍රහ්ම සංකල්පය ප්‍රචලිත වීම.

* පශ්චාත් වෛදික යුගයේදී රජවරුන්ගේ ප්‍රමුඛත්වයෙන් හා බ්‍රහ්මණයන්ගේ උපදේශකත්වයෙන් සිදුකරන බිලි පූජා බවට පත්වීම.
* බමුණන් තම තත්වය රැක ගැනීමට සංකීර්ණ යාග පැවැත්වූහ.
* ඍග් වෛදික යුගයේ පැවති වර්ණ හෙවත් කුල ක්‍රමය පශ්චාත් වෛදික යුගයේදී සංකීර්ණ බවක් ගැනීම.
* සතර ආශ්‍රම ධර්ම බල පැවැත්විණ. ආදී වශයෙන් වර්ධනය වූ ආකාරය විස්තර කරන්න.

03. **1. නාගරික සැලසුම් :**
* මොහෙන්ජොදාරෝ - හරප්පා නගර 2 ආශ්‍රිතව ලැබී ඇති ගොඩනැගිලි ශේෂයන් සාක්ෂි දැරීම.
* මහල්සහිත ගොඩනැගිලි, නාම කාමර හා සැපපහසුකම් ඇති ගොඩනැගිලි.
* නගරය ඇතුල් නුවර හා පිටිනුවර ලෙස කොටස් 3කින් යුක්ත වීම.
* ඇතුළු නුවර ගොඩනැගිලි උස් අත්තිවාරමක් මත ඉදිකර තිබීම.
* පිටිනුවර සමචතුරස්‍රාකාරවද ඇතුලු නුවර ආයාත සැලසුමකටද නිමකර තිබීම.
* ප්‍රධාන වීදි හා අතුරු මාර්ග තනා තිබීම. බොහෝ නිවාස මහල් නිවාස ලෙස තනා තිබීම.
* මැද මිදුලක් සහිතව ගොඩ නැගූ ගෙවල් ධනවතුන්ගේ යැයි සිතිය හැකිවීම.
* නිවාසවලට පිවිසෙන දොරටු ප්‍රධාන මාර්ගයට නොව පටු මාර්ගයට මුහුණපාන ලෙස තනා තිබීම.
* වෙනත් ශිෂ්ටාචාරයක දක්නට නොලැබෙන අන්දමේ විශිෂ්ඨ කානු පද්ධතියක් ගොඩනගා තිබීම.
* අපිරිසිදු ජලය බැසයාමට කාණු පද්ධතියක් තාන තිබීම. කාණු පිරිසිදු කිරීමට ප්‍රමාණවත් දුරකින් පිවිසුම් කවුළු තනා තිබීම.
* කම්කරුවන්ගේ යැයි සැලකිය හැකි නිවාස පන්තියක් හමුවීම.
* ධාන්‍යාගාරයක් යැයි සිතිය හැකි ගොඩනැගිල්ලක නටඹුන් හමුවීම.

**2. <u>පරිහානිය හා බිඳ වැටීම :</u>**
* විවිධ මත වලවීම.
* මෝටිමර් වීලර්, ජෝන් මාර්ෂල් වැනි අය ජලගැලීමක් නිසා විනාශයට පත්වන්නට ඇතැයි විශ්වාස කරති.
* ජනගහනය වැඩිවීම, ආර්ථික පරිහානිය වැනි ක්‍රමික පරිහානිය නිසා විනාශයට පත් වූ බව.
* හදිසියේ ඇති වූ ගින්නකින් විනාශ වූ බව.
* මහා පරිමාණයෙන් දැව ලබාගෙන ගඩොල් පිළිස්සීම සඳහා වනාන්තර විනාශ කිරිමෙන් ඇති වූ දේශගුණික වෙනස්කමක් නිසා විනාශ වූ බව.
* ආර්යයන්ගේ පහරදීමකින් විනාශ වූ බව.. ආදී වශයෙන් විස්තර කරන්න.

04. (i) බෘහද්රථ රජු

(ii) පුෂ්‍යමිත්‍ර ශුංග, ශුංග රාජ වංශය

(iii) * දිග්විජය ප්‍රතිපත්තිය වෙනුවට ධර්ම විජය ප්‍රතිපත්තිය අනුගමනය කිරීම.
* සැමටම සාධාරණ පාලන තන්ත්‍රයක් නිර්මාණය කිරීමට උත්සාහ කිරීම.
* අශෝක දර්මය ඉන්දියාවපුරා ව්‍යාප්ත කිරීම.
* ධර්මාන්විත අදහස් ඇතුළත් ශිලා ලේඛන පිහිටුවීම.
* මව්පියන්ට වැඩිහිටියන්ට කීකරු වීම, සතුන් කෙරෙහි දයාව දැක්වීම, දහමෙහි රැකීම, ගුරුන්ට වතාවත් කිරීම, නෑදෑහිතමිතුරන්ට, මහණ බමුණන්ට සංග්‍රහ කිරීම, දන්දීම.
* පරපණ නොනැසීම, අරපරෙස්සම්බව, අල්ප පිරිකර ඇති බව.
* දැසිදස්සන් කෙරෙහි දයාව, කරුණාව දැක්වීම.
* ධර්මාන්විත අදහස් ඇතුළත් ශිලා ලේඛන, මහා සෙල්ලිපි, ගිරිලිපි, ටැම් ලිපිආදියෙහි කොටවා මිනිසුන්ට දැක ගැනීම සඳහා මාර්ග සන්ධිස්ථාන, නගර, වෙළඳසැල් ආදී මගින් ගැවසෙන ස්ථානවල පිහිටුවීම.
* ධර්මය අනුව ජීවත්වීමෙන් ලැබෙන ඉෂ්ඨවිපාක මෙන්ම අධෛර්යයෙන් ජීවත් වීමෙන්ලැබෙන අනිෂ්ඨ විපාක ගැන ද සඳහන් කිරීම.
* 'සියලු වැසියා මාගේ දරුවෝය' යනුවෙන් ධෞලි ගිරිලිපියෙහි සඳහන් කොට තිබීම ආදී වශයෙන් විස්තර කරන්න. (ල. 6)

(iv) * මෞර්‍ය අධිරාජ්‍ය පිරිහීමට අශෝක රජු බුදු දහමට විශේෂ සැලකිල්ලක් දැක්වීම නිසා බ්‍රාහ්මණ විරෝධයක් මතු වූ බව හරි ප්‍රසාද් රායි චෞද්‍රි යන අය මතයක් ප්‍රකාශ කර ඇත.
* දුර්වල පාලකයන් බලයට පත්වීම. * රාජ සභාවේ පැවති අභ්‍යන්තර කුමන්ත්‍රණ.
* ප්‍රාන්ත රාජ්‍යවල පරිපාලනය දුර්වල වීම. * ප්‍රාදේශීය පාලනය මධ්‍ය පාලනයෙන් ගිලිහි යාම.
* ආර්ථික පරිහානිය. * දුර්භික්ෂය නිසා රජයට ලැබුණු ආදායම් අඩුවීම.
* ක්‍රි.පූ. 187 දී විදේශ ආක්‍රමණ එල්ල වීම.

මෙවැනි සිද්ධීන් රැසක් මෞර්ය අධිරාජ්‍යයේ පරිහානියට බලපෑ බව කියවෙන අතර අශෝක රජුගේ ප්‍රතිපත්ති ඉවහල් වීය යන්න එලෙසින්ම කිව නොහැකිය. (ල. 7)

05. * ක්‍රි.පූ. 6 වන සියවස වන විට උතුරු ඉන්දියාවේ සොළොස් මහාජනපද නමින්ද ජනපද 16 ක් බිහි වීම. අංග, මගධ, කාසි, කෝසල, වත්ස, අවන්ති ඉන් ප්‍රබල රාජාණ්ඩු කිහිපයක් බිවීම,
* ගණ හෙවත් සංඝ යනුවෙන් ප්‍රජාතන්ත්‍රවාදී පාලන තන්ත්‍රයක් බිහිවීම.
* රාජාණ්ඩු පාලන ක්‍රමයේ රජු ප්‍රධාන විය. ඔහුට විධායක, ව්‍යවස්ථාදායක හා අධිකරණ බලතල හිමිවිය. රජුගේ පාලනයට සහභාගීවීමට මන්ත්‍රී පර්ශද් නමින් පාලක කණ්ඩායමක් සිටි බව පුරෝහිත සේනාධිපති, භාගධුග , සූත වැනි නිලධාරීන් රජුගේ පාලනයට සහභාගි වූ බව.
* රජුට ඇත්, අස්, රිය, පාබල වන අංශවලින් යුත් චතුරංගනී සේනාවක් සිටි බව. යුද්ධයේදී අධිපතියා රජු බව.
* රාජාණ්ඩුවල රජවරු මත්ස්‍ය න්‍යාය අනුගමනය කරමින් කුඩා රාජ්‍ය ගිල ගැනීමේ ව්‍යාපාරයක් ගෙන ගිය බව.
* එම රාජ අල්ලා ගැනීමේ ව්‍යාපාරයට අමතරව දේශපාලන විවාහ මගින්ද රාජ්‍යයන් අවනත කර ගැනීම.
* සමූහාණ්ඩු පාලන ක්‍රම මගින්ද සමහර ජනපද පාලනය කිරීම.
* සප්ත අපරිහානීය ධර්ම වලට අනුව පාලන කටයුතු ගෙන යාම.
* සංඝ හෙවත් සංඝ නමින් හැඳින්වූ සමූහාණ්ඩු 9ක් ගැන සඳහන් වීම.
* මේවායේ රාජ්‍ය ප්‍රධානීන් ගණපති. ගණ ජ්‍යෙෂ්ඨ, ගණරාජන් යන නම්වලින් හැඳින්වීම.
* ප්‍රජාතාන්ත්‍රීය ලෙස මේවායේ පාලන කටයුතු මෙහෙයවන ලදී.
* වැරදිකරුවන්ට දඩුවම් දුන්නේ පැරණි පුස්තකවලට අනුවය. පාලකයින්ට හිතූ මනාපයට දඩුවම් නියම කිරීම සිදු නොවීය.
* ලිච්ඡවී රජදරුවන් 7707ක් සිටි බව සඳහන් වේ... ආදී ලෙස විස්තර කරන්න.

## II කොටස

06. **(i) <u>සංස්කෘතික අභිවර්ධනය :</u>**
* කණිෂ්ක රජු මුලින් අබෞද්ධයෙකු වී පසුව බෞද්ධයෙකු වී බුදු දහමේ දියුණුවට කටයුතු කිරීම.
* පාර්ශව තෙරුන්ගේ අනුශාසනා නිසා බෞද්ධයෙකු වී යැයි සැලකේ.
* කණිෂ්ක රජු බුදු සමය වැළඳ ගැනීම අශෝක රජු බුදු දහම වැළඳ ගැනීම මෙන්ම ශාසන ඉතිහාසයේ වැදගත් වේ.
* කණිෂ්ක රජුගේ ඇතැම් කාසි වල බුද්ධ රූප තිබිණි.
* ඔහු සිය අගනුවර වූ පුරුෂපුරයෙහි මහල් ගණනකින් යුත් ධාතු මන්දිරයක් ඉදිකිරීම. එහි ධාතු කරඬුවක් හා ඛරෝෂ්ඨී අක්ෂරවලින් එය තහවුරු වීම.
* සිව්වන ධර්ම සංගායනාව පැවැත්වීම. එය කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේ පැවැත්වූ බව දැක්වෙන අතර තවත් තැනක එය පංජාබයේ ජලන්දරයේ පැවැත්වීයැයි සඳහන් වේ.
* වසුමිත්‍ර හිමියන් ප්‍රධානත්වය ගෙන ඇති අතර පාර්ශව අශ්වඝෝෂ වැනි තෙරවරුන් ඇතුළු භික්ෂූන් 500 ක් සහභාගී වූ බව.
* මෙම සංගායනාවේදී විභාෂා නමින් හැඳින්වූ අටුවා ග්‍රන්ථ රචනා වීම
1. සූත්‍ර පිටකට - උපදේශ ශාස්ත්‍ර 2. විනය පිටකය - විනය විභාෂා 3. අභිධර්ම පිටකය - මහා විභාෂා
* සංස්කෘත භාෂාව මෙම සංගායනාවේ ප්‍රධාන භාෂා මාධ්‍ය විය.
* මෙම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස මධ්‍යම ආසියාවට හා චීනයට ධර්ම ප්‍රචාරය සිදුවීම.
* මධ්‍යම ආසියාවේ ශාර්මාන්, කෝටාන් හා නීයා වැනිස්ථාන බෞද්ධ මධ්‍යස්ථාන බවට පත්වීම.
* ආගමික සහනසීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.

**(ii) <u>උතුරු ඉන්දියාව එක්සත් කිරීම හා යුධ ජයග්‍රහණ :</u>**
* කුෂාණ රජ පෙළපතේ 3 වන පාලකයාය. යූ.ඒ.චි. ගෝත්‍රයට අයත්ය.
* ක්‍රි.ව. 78 දී පමණ රජවන්නට ඇතැයි විශ්වාස කෙරේ.
* මොහු කාශ්මීරය ආක්‍රමණය කර පුරුෂපුරය (පෙෂාවෝරය)තම අගනුවර කොට ගත්හ.
* කණිෂ්ක රජු යටතේ කුෂාණ අධිරාජ්‍යය ඉන්දියාවේ විශාල ප්‍රදේශයක පැතිරීම වැදගත් දේශපාලන සිද්ධියකි.

* ඔහුගේ අධිරාජ්‍ය කොටස් 2කි.
1. ඉන්දියාවෙන් බැහැරකොටස 2. ඉන්දියාවෙන් ඇතුළත කොටස
* මගධය අත්පත්කරගැනීම නිසා නැගෙනහිර ගංගා නිම්නයේ පාඨලීපුත්‍රය දක්වා කණිෂ්ක අධිරාජ්‍ය විහිදී ගියේය.
* කණිෂ්ක රජු ශක ශත්‍රපයන්ගේ ප්‍රදේශයද අල්ලා ගන්නා ලදී.
* රාජතරංගනියේ කාශ්මීරය කණිෂ්ක රජුට අයත්ව තිබූ බව සැලකේ.
* බටහිර බලුකිස්ථානය, ඔක්සස් ප්‍රදේශය, බැක්ට්‍රියන් ප්‍රදේශත් ආණ්ඩුකාරවරයෙකු ලවා පාලනය කළ බව සඳහන් වේ.
* උතුරින් මධ්‍ය ආසියාතික ප්‍රදේශ වන කැෂ්ගාරය, යාර්මාන්, කෝටාන් හා නීයා වැනිප්‍රදේශද අයත් විය.
* මධ්‍ය ආසියාතික ප්‍රදේශද කණිෂ්කට අයත්වීම නිසා චීනය සමග ගැටුම් ඇතිවිය.
* එක් සටනකදී පංචාවෝ නම් චීන සෙනෙවියා කණිෂ්ක පරාජය කළ බවත්, ක්‍රි.ව. 80 දී පමණ කණිෂ්ක නැවත මධ්‍ය ආසියාතික ප්‍රදේශ පවා යටත් කරගත් බව සඳහන් වේ.
* මේ ඉහත කරුණු අනුව දේශපාලන එක්සත් රාජ්‍යයක් ලෙස පාලනය කිරීම කණිෂ්ක රජුගේ දේශපාලන කාර්ය සංසිද්ධියකි. විස්තර කරන්න. (ල. 16)

07. (i) පුෂ්‍යභූති රාජ වංශය

(ii) හර්ෂ චරිතය, ප්‍රියදර්ශිකා, නාගානන්ද, රත්නාවලී, හියුංසාං වාර්ථා

(iii) * පුෂ්‍යභූති රාජ වංශයේ බලවත්ම පාලකයා ප්‍රභාකරවර්ධන රජුය.

* මෙම රාජ වංශය කනෞජයේ මෞඛරී රාජ වංශය සමග විවාහ සබඳතා මගින් සම්බන්ධතා ගොඩනගා ගෙන ඇත.

* ප්‍රභාකරවර්ධන රජුට හර්ෂවර්ධන, රාජ්‍යවර්ධන හා රාජ ශ්‍රී යනුවෙන් දරුවන් තිදෙනෙකි.

* තම දියණිය රාජ ශ්‍රී කුමරිය කනෞජයේ මෞඛරී වංශික ග්‍රහවර්මන් රජුට විවාහ කරදුනි.

* ප්‍රභාකරවර්ධන රජු දේශපාලන ගැටුමකදී මරණයට පත්වූ අතර, මාල්වාහි පාලක දේවගුප්ත විසින් බෙංගාලයේ සසංක රජුගේ ඉල්ලීමට අනුව ග්‍රවර්මන් රජු මරා රාජ ශ්‍රී කුමරිය සිරභාරයට ගන්නා ලදී.

* එයට විරුද්ධ වූ ගෞඩ දේශයේ සසංක රජු රාජ්‍ය වර්ධන මරා දැමීය. ඉතිරි වූයේ හර්ෂවර්ධන රජු පමණි.

* තම සොහොයුරිය බේරා ගැනීම මෙන්ම රාජ්‍ය ආරක්ෂා කර ගැනීමද ඔහුට බාරවිය.

* වින්ධන කඳු වැටියේ සති පූජාවට සූදානමින් සිටි රාජ ශ්‍රී කුමරිය බේරාගත් හර්ෂ රජු ඇයට රජකම භාර දුන්නද ඇය එය ප්‍රතික්ෂේප කළාය.

* ඇය රජකම භාර නොගැනීම නිසා ඇමතිවරුන්ගේ ආරාධනාව මත ක්‍රි.ව. 608 දී කනෞජගේ සිහසුන බාරගන්නා ලදී. (ල. 4)

(iv) යුද්ධ ව්‍යාපාර - ප්‍රධාන සටන් ව්‍යාපාර 4ක් පිළිබඳ සඳහන් වේ.

1. වලභි හා ගුර්ජ්ර පාලනයත් සමග සටන 2. චාලුක්‍ය වංශික II පුලකේශීන් සමග සටන

3. සින්දු ප්‍රදේශය ආක්‍රමණය කිරීම. 4. නැගෙනහිර ආක්‍රමණය - ආදිය විස්තර කරන්න.

**<u>ආගමික හා සංස්කෘතික කටයුතු :</u>**

* බෞද්ධයෙකු වීම නිසා බුදු දහමට විශාල සේවයක් සිදු කිරීම.

* නාලන්දා විහාරයේ තඹ වහලයකින් සමන්විත ආරාමයක් කරවීම

* අන්‍ය ආගමික නිකායන්වලටද අනුග්‍රහයදැක්වීම.

* රජු විසින් ආගමික සම්මේලන 2ක් පැවැත්වීම. මෙයට ප්‍රාදේශික රජවරු, ඇමතිවරු, බෞද්ධ භික්ෂූන්, බ්‍රාහ්මණයින් සහභාගි වී ඇත.

* ප්‍රධාන නගරයෙහි මෝක්ෂ පර්ශද් නමින් හඳුන්වන පංච වාර්ෂික දානයක් දෙන ලදී.

* උගතුන්ට අනුග්‍රහය දැක්වීම රජු විසින් නාගානන්ද, ප්‍රියදර්ශිකා, රත්නාවලී යන පොත් රචනා කිරීමෙන් රජුගේ පාණ්ඩිත්‍ය හෙළි වේ.

* රජුගේ ප්‍රධාන ඇමති බාණභට්ට කවියා හර්ෂ චරිතය. කාදම්බරී යන ග්‍රන්ථ රචනාකිරීම.

* රාජ්‍ය ආදායමින් 1/4 ක් ශිෂ්‍යත්ව දෙමින් උගතුන්ට අනුග්‍රහය දැක්වීම.

* නාලන්දා, තක්ෂිලා, වලභි යන බෞද්ධ අධ්‍යාපන ආයතනවලට අනුග්‍රහ දැක්වීම. ආදිය විස්තර කරන්න. (ල. 8)

08. (A) * පුරාණ ග්‍රන්ථවලට අනුව ශුංග හා කාන්ව රාජවංශ පරාජය කරමින් සාතවාහන නමිනව රාජ වංශයක් ගොඩනැගූ මුල්ම පුද්ගලයා සිමුක නැමැත්තාය.

* මොහුගෙන් පසු I සාතකර්නී ගෞතමී පුත්‍ර, සාතකර්නි වාශිෂ්ඨ පුත්‍ර, පාලුමායි, ශිව සාතකර්ණි ශ්‍රී යශු සාතකර්ණි වැනි රජවරුන් කීප දෙනෙකු යටතේ සාතවාහන බලය ව්‍යාප්ත විය.

* මෙකල දේශපාලන ඒකාබද්ධතාවයක් නොමැතිවීම හේතුකොටගෙන පසුකාලයේ සාතවාහන බලය ඩෙකැනයට හා සනාර රාජ්‍යයට පමණක් සීමා විය.

* මෙකල සමාජ තත්වය පංති 4කට බෙදී තිබිණි.

1. ඉහළ පංතිය - මෙයට රජවරු, මහාරථී, මහා බෝජ හා මහා සේනාධිපති වැනි ඉහළ නිලධාරීන් අයත් විය.

2. ද්විතීය පංතිය - අමාත්‍ය, මහා අමාත්‍ය, භාණ්ඩාගාරික, වෙළඳුන්, සාර්තවාහවරු නගර ශ්‍රේෂ්ඨීන්, මෙම කණ්ඩායමට අයත් විය.

3. තුන්වැනි පංතිය - ලේඛක, වෛද්‍ය ගොවියන් සුවර්ණාකාර හෙවත් රන්වැඩ කරන්නන්, ගානිධීනී හෙවත් සුවඳ විලවුන් නිපදවන්නන්.

4. හතරවන පංතිය - වර්ධනී, මාලාකාර, ලෝහ වාණිජ හෙවත් කම්මල්කරුවන්, දාසයන්, මාලු අල්ලන්නන් මේ පංතියට අයත් වූහ.

* මේ සියලු අංශවලින් පවුල ප්‍රධාන විය. පවුල කුටුම්භ නමින් හැඳින්වින. පවුලේ ප්‍රධානියා ගෘහපති විය. විවිධ ආර්ථික ක්‍රියාකාරකම් මත විවිධ ශ්‍රේණි සංවිධානය වි තිබුණි.

උදා : කුඹල්කරුවන්, රෙදි වියන්නන්, තෙල් නිපදවන්නන්, ධාන්‍ය වෙළඳුන් මේ ශ්‍රේණි ලෙස දක්නට ලැබුණි.....ආදි ලෙස විස්තර කරන්න.

**<u>ආගමික තොරතුරු :</u>**

* සාතවාහන යුගයේ දක්ෂිණපථයේ ආගමික සහනශීලීබව වර්ධනය විය.

* බ්‍රාහ්මණ ආගමේ දියුණුවක් දක්නට ලැබිණ.

* රජවරු අශ්වමේධ යාගහා රාජසූය වැනි යාග පැවැත්වීම.

* ශිව, විෂ්ණු, වාසුදේව, ඉන්ද්‍ර, කෘෂ්ණ, ගනේෂ, පශුපති වැනි දෙවිවරුන්ට වැදුම් පිදුම් කිරීම.

* රජවරු හින්දු භක්තිකයන් විම නිසා, හින්දු ආගමේ දියුණුවක් ඇතිවීම.

* වර්ණාශ්‍රම ධර්ම නැවත පණගැන්වීම.

* ආගමික මධ්‍යස්ථාන සංස්කෘතිකමය වටිනාකමක් ඇති මධ්‍යස්ථානයක් ලෙස වර්ධනය වීම.
* කාර්ලේ, නාසික්, කැන්හේරි යන ස්ථානවල ගුහා චිත්‍ර නිර්මාණය කිරීම.
* බෞද්ධ ආගමික අනුග්‍රහය දැක්වීම.
* ඩෙකැනයේ මහායාන බුදුදහම විකාශනය වීම. * වෙහෙර විහාර බෞද්ධ ප්‍රතිමා නිර්මාණය වීම. * විහාරස්ථාන ආශ්‍රිතව ප්‍රතිමා කැටයම් චිත්‍ර කලාව දියුණු වීම. * අමරාවතී නාගර්ජුන කොක්බ ප්‍රදේශවලින් ස්තූප, කැටයම්, මූර්ති හමුවීම.
* බෞද්ධ භික්ෂූන්ගේ නඩත්තුව සඳහා හා වෙහෙර විහාර නඩත්තුවට රජවරු ගම්බිම් පූජාකිරීම.
*මේ අනුව සාතවාහනවරු හින්දු හා බෞද්ධ යන ආගම් දෙකටම සැලකූ බව පෙනේ.... ආදී ලෙස විස්තර කරන්න. (ල. 16)

(B) * කණිෂ්ක රාජ්‍ය කාලයේ ඉන්දියාවේ මහායානබුදු දහම ව්‍යාප්ත වීම.
* 4 වන ධර්ම සංගායනාව කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේ පැවැත්විය. පංජාබයේ ජලන්ධරයේද පැවැත්වූ බවට ද මතයක් ඇත.
* වසුමිත්‍ර හා අශ්වඝෝෂ හිමිවරුන්ගේ දායකත්වයෙන් මෙය පවත්වා ඇත.
* මෙකල ඉන්දියාවේ බුදු සමය නිකාය 18 කට බෙදී තිබුණි.
* මහා සංඝික, පූර්ව සේලිය, අපර සේලිය. හේවාසිකභදායානීය. සර්වාස්තිවාදී වැනි නිකායන් පෞද්ගලික ලාභ ලබමින් ශාසනය අපිරිසිදු කළ නිසා මෙය සංගායනාව පවත්වන ලදී.
* ත්‍රිපිටක ග්‍රන්ථවල පිටපත්ද, බ්‍රාහ්මණ ඉගැන්වීම්වල ධර්ම කොටස්ද සම්බන්ධ කොට මහා විභාෂා ශාස්ත්‍ර නම් අටුවා ග්‍රන්ථ ලියන ලදී.
* මහායාන ත්‍රිපිටකය සකස් කරන ලදී.
*මේ අටුවා විනය විභාෂා සූත්‍ර විභාෂා, අභිධර්ම විභාෂා යනුවෙන් තඹපත්වල ලියා පෙෂාවෝරයේ ධාතුස්ථම්භයේ තැන්පත් කිරීම.
* දෙවියන් පිළිබඳ විශ්වාසය, බෝධිසත්ව සංකල්පය මෙම සංගායනාවෙන් පසුවර්ධනය වීම.
* මෙම සූත්‍ර සංස්කෘත භාෂාවෙන් ලියැවීම.
* බෝධිසත්ව බලපෑම නිසා ප්‍රතිමා වන්දනාවටද විශේෂ ස්ථානයක් හිමිවිය.
* ගාන්ධාර කලා සම්ප්‍රදාය අනුව මෙම ප්‍රතිමා නිර්මාණය වීම.
* ප්‍රථම වරට බුද්ධ ප්‍රතිමා නෙලීම ආරම්භ වීම.
* එතෙක් බුදුන් වහන්සේ වෙනුවට වන්දනා කළ ශ්‍රී පතුල, ධර්ම චක්‍රය බෝ පත්‍ර වැනි සංකේත වෙනුවට බුද්ධ ප්‍රතිමා නෙලීම ඇරඹීම.
* මේ නිසා මහායාන ධර්මය ජනතාව අතර ප්‍රචලිත වීම.
* මෙම අදහස් ඉන්දියාවෙන් පිටතද ව්‍යාප්තවීම. දකුණු ඉන්දියාව හරහා ශ්‍රී ලංකාවට, මධ්‍ය ආසියාවට, චීනයට හා අග්නිදාග ආසියාවට ව්‍යාප්ත වීම.
* මාතාංග හා ධර්මරතන හිමිවරුන් මධ්‍ය ආසියාවේ යාර්ඛාණ්ඩ්, කැෂ්ගාර්, බෝටාන් වැනි ප්‍රදේශවලට මහායාන ආගම පැතිරවීය.
* චීන භික්ෂූන් මෙම ප්‍රදේශවලට පැමිණ නැවතී මහායානික ධර්මය හදාරා ඇත. මහායානික බෞද්ධ ග්‍රන්ථ චීන භාෂාවට පරිවර්තනය කිරීමට අශ්වඝෝෂ, වසුමිත්‍ර, නාගර්ජුන, වසුබන්ධු, ආර්යදේව, සංඝමිත්‍ර වැනි උගත් භික්ෂූන් ප්‍රමුඛ වූහ. ආදිය විස්තර කරන්න. (ල. 16)

09.**1.** **<u>ගුප්තයන් යටතේ සිදු වූ සාහිත්‍ය වර්ධනය :</u>**
* ගුප්ත පාලකයන් යටතේ ඉන්දියාවේ ස්වර්ණමය යුගයක් ගොඩ නැගුණි.
* ගුප්ත රජවරු සාහිත්‍ය දියුණු කිරීමට විශාල මෙහෙයක් සිදු කරනලදී.
* සංස්කෘතිකභාෂාව සාහිත්‍යමය භාෂාවක් ලෙස උපරිම දියුණුවක් ලැබිණි.
* ආගම, දර්ශනය, ගණිතය, වෛද්‍ය ශාස්ත්‍රය වැනි විවිධ ශාස්ත(වලින් ග්‍රන්ථ රචනා කරන ලදී.. උගත් පඬිවරු රාශියක් මෙකල බිහිවිය.
* II චන්ද්‍රගුප්ත රජුගේ රාජ සභාව නවරත්න කවීන්ගෙන් සමන්විත විය.
* කාලිදාස එකල සිටි ශ්‍රේෂ්ඨ පඬිවරයෙකි. මොහු විසින් සාකුන්තලය මාලවිකාග්නිමිත්‍ර, වික්‍රමෝවර්ශී යන නාට්‍ය ග්‍රන්ථ ද මේඝදූතය, ඍතු සංහාරය, යන කාව්‍ය ග්‍රන්ථද සංස්කෘත සාහිත්‍යයේ ශ්‍රේෂ්‍ය ග්‍රන්ථ 2ක් වූ කුමාර සම්භවය හා රඝු වංශයද රචනා කර ඇත.
* විශාඛදත්තගේ මුද්‍රාරාක්ෂය හා දේවිචන්ද්‍රගුප්ත යන නාට්‍ය 2ද ශුද්‍රක විසින් රචිත මෘච්ඡකටිකා නාට්‍ය ග්‍රන්ථයද අමරාසිංහ විසින් සංස්කෘත භාෂාවේ ශබ්ද කෝෂයක් වූ අමර කෝෂයත්, භාරවී විසින් කිර්තාර්ජුනිය හා ශිශුපාලවට නම් මහා කාව්‍ය 2ත් රචනා කරන ලදී. භට්ටිගේ දශමුඛවධවම් නාට්‍ය, හරිතෘහරිගේ ශතක ග්‍රන්ථයක් නිසා සංස්කෘත භාෂාව බෙහෙවින් වර්ධනය විය.
* අලහබාද් ප්‍රශස්තිය නම් කාව්‍යමය ශිලා ලේඛනය හරිසේන කවියා විසින් මෙකල ලියන ලදී.
* ගණිතඥයෙකු හා තාරකා විශේෂඥයෙකු වූ ආර්යභට විසින් භට්ටිය හා සූර්ය සිද්ධාන්ත යන ග්‍රන්ථ 2ක රචනාකරන ලදී.
* ආර්‍ය භට්ටිය නම් ග්‍රන්ථයේ ගණිතය, ජ්‍යාමිතිය, අංක ගණිතය , ශුද්ධ ගණිතය යන විෂයන් විස්තර කරයි.
* වරහ මිහිර රචනා කළ බෘහද් සාංහිතාවෙහි ගණිතය, තාරකා විද්‍යාව , උද්භිද විද්‍යාව, භූගෝල විද්‍යාව යන විෂයන් විග්‍රහ කරයි.

* වෘහද්වාග්භට විසින් අෂ්ටාංගහෘදය නම් වෛද්‍ය ග්‍රන්ථය රචනා කිරීම නිසා ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේදී දියුනුවක් මෙකල දක්නට ලැබුණි.. ආදී විස්තරකරන්න.

2. **ක්‍රි.පූ. 6 වනසියවසේ උතුරු ඉන්දියාවේ රාජධානි :**
* වෛදික ආර්යයන් ගංගා යමුනා ආශ්‍රිත මධ්‍ය ඉන්දියාවට පැමිණීමත් සමග' එම ප්‍රදේශවල ජනපද ආරම්භ කර ජීවත්වීම. එවැනි ජනපද 16ක් ගැන සඳහන් වීම. ඒවා සොළොස්මහා ජනපද නමින් හැඳින්වීම. අංග, මගධ, කාසි, කෝසල, වජ්ජි, මල්ල, වත්ස, අවන්ති යනුවෙන් ඒවා නම් කිරීම.
* මේවායින් ගාන්ධාර සහ කාම්බෝජ ජනපද දෙක ආර්යයන් පදිංචි වූ වයඹ දිග ඉන්දියාවේ පැවති අතර, දක්ෂිණ පථයට අස්මක ජනපදය ව්‍යාප්ත වීමෙන් පැහැදිලි වන්නේ වින්ද්‍යාවෙන් දකුණටද ආර්යයන් ව්‍යාප්ත වූ බවයි.
* අනෙක් ජනපද 13 ම ගංගා යමුනා ආශ්‍රිත මධ්‍ය ඉන්දියාවේම ව්‍යාප්ත විය.
* මේවාගේ ක්‍රියාත්මක වූ පාලන ක්‍රම 2කි.
1. රාජාණ්ඩු පාලන ක්‍රමය 2. සමූහාණ්ඩු පාලන ක්‍රමය
* ඒකාධිපතිත්වයෙන් පාලනය වූ රාජාණ්ඩු 4කි. ඉන් ප්‍රබල වූයේ මගධයයි. විවිධ උපක්‍රම මගින් ඔවුන් තම රාජ්‍ය විශාල කර ගැනීමට උත්සාහ කරන ලදී.
* තවත් සමහර ජනපද සණ, සංඝ හෙවත් සමූහාණ්ඩු වශයෙන් පාලනය කෙරිණි. මෙම ජනපදවලින් වජ්ජි හා මල්ල රජවරු සමූහාණ්ඩු පානයක් ගෙන ගිය අතර මෙවැනි සමූහාණ්ඩු 9ක් ගැන බුද්ධ කාලීන භාරතයේ සඳහන් වේ.
* මේවායේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ගෙන ගිය අතර සියලු දෙනාට පාලනයට සහභාගීවීම සඳහන් විය. මෙවැනි ලිච්ඡවී රජවරු 7707 ක් සිටි බව බෞද්ධ සාහිත්‍යයේ දැක්වේ. ආදී ලෙස විස්තර කරන්න.

3. **හූණ ආක්‍රමණයෘ**
* මධ්‍ය ආසියාවේ සිට ඉන්දියාවට ආක්‍රමණ මෙහෙයවූ ගෝත්‍රික කණ්ඩායමකි.
* ඉන්දියාවට පැමිණි සුදු හූණවරු ස්කන්ධ ගුප්ත කාලයේ මුලින්ම පැමිණියද ඒවා මැඩ පැවැත්වීමට ස්කන්ධ ගුප්ත රජු සමත් විය.
* නැවත නරසිංහ ගුප්ත රජුගේ කාලයේ හූණ ආක්‍රමණ එල්ල විය.
* බුධ ගුප්ත රජුගේ කාලයේ ක්‍රි.ව. 6 වන සියවසේ තෝරමාන යටතේ හූණවරු පංජාබය හරහා ඉන්දියාවේ අභ්‍යන්තරයට පැමිණියහ.
* උත්තර ප්‍රදේශයේ පංජාබයේ රාජ්පුනානා, පංජාබ්, කාශ්මීර් ආදී ප්‍රදේශවලින් හමු වූ කාසි මගින් එම තොරතුරු අනාවරණය වේ.
* ක්‍රි.ව. 515 දී මිහිරකුළ ආක්‍රමණිකයා පැමිණ සියල්කොට් හෙවත් සාගල අගනුවර කොට ගෙන අමානුෂික ලෙස ඉන්දියාව ආක්‍රමණය කළ බව හියුංසාං වාර්තාවල සඳහන් වේ.
* මෙම ආක්‍රමණිකයන් පසු කාලයේ වයඹ දිග ඉන්දියාවට සීමා වූ අතර ගුප්ත අධිරාජ්‍යයේ පරිහානියට හූණ ආක්‍රමණ එක් හේතුවක් බව කිව හැකිය.
* මැන්ඩසෝරයේ යශෝවර්මන් විසින් හූණ ආක්‍රමණ මැඩ පැවැත්වීම නිසා ප්‍රජා බලය වයඹදිග ඉන්දියාවට සිමා විය. ආදී ලෙස විස්තර කරන්න.

4. **චන්ද්‍රගුප්ත මෞර්ය**
* ක්‍රි.පූ. 324 - 300 කාලයේ මගධ අධිරාජ්‍ය පාලනය කන ලදී.
* මගධයේ ආරම්භක පාලකයා හා එහි පදනම සකස් කළ පාලකයා මොහුය.
* කෞටිල්‍ය බ්‍රාහ්මණයාගේ සහායෙන් වයඹ දිග ඉන්දියාවේ තක්ෂිලාවේ අධ්‍යාපනය ලබා මගධයේ ධනනන්දගේ දූෂිත පාලනයෙන් මුදා ගැනීමට කටයුතු කළේය.
* අධිරාජ්‍යයේ බලය තහවුරු කර ගැනීම සඳහා සමත් ව්‍යාපාර කීපයක් කරන ලදී.
* ක්‍රි.පූ. 324දී පමණ ධනනන්ද ජීවිතක්ෂයට පත්කොට මගධ අදිරාජ්‍යයේ බලය ලබා ගන්නා ලදී.
* කෞටිල්‍ය පුරෝහිත තනතුරේ තබාගෙන අවශ්‍ය උපදෙස් ලබාගන්නා ලදී.
* අනතුරුව වයඹදිග ඉන්දියාව යටත් කර ගන්නා ලදී.
* ඇලෙක්සැන්ඩර් රජුගේ ආක්‍රමණ නිසා වයඹ දිග ඉන්දීය ජනතාවට දේශීය රජෙකුගේ අවශ්‍යතාව දැණිනි.
* වයඹ දිග සින්දු ගඟෙන් එපිට සෙලියුතස් නිකේටර්ට අයත්ව තිබූ සෙලියුකිඩ් රාජ්‍යයද මගධයට ඈඳ ගනී. ඒ වන විට ග්‍රීක පාලනයේ පැවති ගෙඩ්රෝෂියා (බලුකිස්ථානය) ඇරකෝෂිනා(කන්දනාත්) පරෝපනිසදායි. (කාබුල්) ඒරියා (හේරාට්) ප්‍රදේශ මගධයට ඈඳ ගනී.
* සටනින් පසු ඇති වූ ගිවිසුම අනුව චන්ද්‍රගුප්ත රජුට ඉහතින් සඳහන් කළ ප්‍රදේශ හා තම බිසව ලෙස සෙලියුකස් නිකේටර්ගේ දියණිය හා තෑගි වශයෙන් ඇතුන් 500ක්ද තෑගි ලෙස ලැබුණි.
* දකුණු ඉන්දියාවේ තින්නවේලි දක්වා බලය ව්‍යාප්ත කළ බව සඳහන් වේ.
* චන්ද්‍රගුප්ත රජු යැයි අනුමාන කරන ඩම්බ මෝරියර් නමැති රජෙකු විසින දකුණු ඉන්දියාවේ තින්නවේලි ප්‍රදේශයට ආක්‍රමණයක් එල්ල කළ බව පැරණි දෙමළ සාහිත්‍ය කෘතිවල සඳහන් වේ.
* මෞර්ය අධිරාජ්‍යයාගේ බොහෝ ප්‍රදේශ ජයග්‍රහණය කළේ චන්ද්‍රගුප්ත මෞර්ය රජුය. බිංදුසාර රජුද එම ප්‍රදේශ රැකගත් අතර, අශෝක රජු විසින් කාලිංගය පමණක් යටත් කිරීමෙන් පැහැදිලි වන්නේ චන්ද්‍රගුප්ත මෞර්ය රජු විශාල අධිරාජ්‍යයක් ගොඩනැංවූ බවයි. ඒ සමඟම මගධය මුල්කරගෙන ක්‍රමවත් පාලන තන්ත්‍රයක් ගෙන යාමටද ඔහු සමත් විය. ආදී ලෙස විස්තර කරන්න. (එක් කොටසකට ලකුණු 8 බැගින් මුළු ලකුණු 16)